කාර්ය සාධන වාර්තාව -2013

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

කොලොන්නාව.

2013 වර්ෂය සඳහා වන රජයේ කර්මාන්තශාලා කාර්ය සාධන වාර්තාව

01 හැඳින්වීම

1.1 රජයේ කර්මාන්තශාලාවේ මෙහෙවර වනුයේ යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රයේ වැඩ, නිෂ්පාදන, උපදේශන සේවා සහ ආධුනිකයින්, ශිල්පීන්, තාක්ෂණ ශිල්පීන්, උපාධි අපේක්ෂක ආධුනිකයින් හා යාන්ත්‍රික ඉංජිනේරුවරුන් සඳහා කර්මාන්ත ශාලා වැඩබිහල නිෂ්පාදන සහ වැඩ සම්බන්ධ ප්‍රායෝගික පුහුණුව ලබාදීම යනාදී වැඩ සහ සේවාවන් සැපයීමයි

1.2 රජයේ කර්මාන්තශාලාවෙන් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන කාර්යයන්

නිෂ්පාදන හා නඩත්තු වැඩබිහල් සඳහා වන මෙහෙයුම්

කාර්ය මණ්ඩලයයේ සහ පුහුණුවන්නන් සඳහා වන මානව සම්පත් සංවර්ධනය

නිෂ්පාදිතයන් සහ නඩත්තු සේවා සඳහා වන විධිවිධාන

අමුද්‍රව්‍ය, ආයුධ හා උපකරණ සඳහා වන ප්‍රසම්පාදන කටයුතු

1.3 ව්‍යාපාරික අත්තිකාරම් ගිණුම් දෙකක් පවත්වාගෙන යාම - ඉහත සඳහන් කාර්යයන් ඉටුකර ගැනීම සඳහා කළ වැඩ අත්තිකාරම් ගිණුම හා ගබඩා අත්තිකාරම් ගිණුම පවත්වාගෙන යනු ලැබේ.

1.4 රජයේ කර්මාන්තශාලාව විසින් තත්කාලීනව කරනු ලබන ප්‍රධාන නිශ්පාදන කාර්යයන් හා ලබා දෙනු ලබන සේවාවන් වන්නේ.

- ආරෝග්‍යශාලා ගෘහ උපකරණ හා මෙවලම් නිශ්පාදනය කිරීම
- ජල කළමනාකරණය සඳහා වන වාත්තු යකඩමය නිශ්පාදන අරිය දොරටු, දව්ගුලු දොරටු හා පත් දොරටු
- වාත්තු යකඩමය නිශ්පාදනයන් (මැන්හෝල් සැකිලි හා පියන් - ජල කළමනාකරණ උපකරණ)
- ලී භාණ්ඩ හා අනෙකුත් ලී නිශ්පාදිතයන්
- මාර්ග බාධක හා සංඥා පුවරු
- යාන්ත්‍රික සයිරන් නලා, වර්ෂ, මාස හා දින කොටස් ඇතුළත් තැපැල් මුද්‍රා

- ස්ක්‍රීන් මුද්‍රණ, ඩිජිටල් මුද්‍රණ, දැන්වීම් පුවරු, කැටයම් වැඩ සහ ඒහා බැඳුනු සේවාවන් සහ එම්බොස් (ඉලූප්පුම්වැඩ)

- පවුඩර් කෝටින් සහ යාන්ත්‍රික පින්තාරු වැඩ

- සියලූ ආකාරයේ පාටිෂන් (වෙන් කිරීම්)වැඩ, ඇලූමිනියම් දොරවල් හා ජනෙල් නිෂ්පාදනය

- බිත්ති පනේල (කැටයම්) කිරීම හා

- කැපීම, සිදුරු කිරීම, එතීම, හිල් විදීම (ඩ්‍රිල් කිරීම) වෑල්ඩින් වැඩ සහ කම්මල් වැඩ

- විශාල පිරිසැකසුම් වැඩ , සැහැල්ලූ පිරිසැකසුම් වැඩ හා කම්මල් වැඩ

- යන්ත්‍රෝපකරණ සවිකිරීම

- යන්ත්‍රෝපකරණ අලූත්වැඩියා කටයුතු හා සේවා සැපයීම් කටයුතු

- මොටර් රථ වාහන අලූත්වැඩියාව හා සේවා සැපයීම්

- විදුලි යාන්ත්‍රික වැඩ

- විදුලි ස්ථාපනයන් හා අළුත් වැඩියාවන්

- ඉලෙක්ට්‍රො ප්ලෙටින් (විද්‍යුත් ලෝහාලේපනය)

2.0 මානව සම්පත් දත්ත

2.1 අනුමත කාර්යය මණ්ඩලය, පුරප්පාඩු හා අතිරික්ත

තනතුර	අදාල වන සේවය	අනුමත තනතුරු සංඛ්‍යාව	දැනට සේවයේ යෙදී ඇති සංඛ්‍යාව		පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්තය
		ස්ථිර	ස්ථිර	අනියම්/ කොන්ත්‍රාත්	-	
ජ්‍යෙෂ්ඨ මට්ටම						
කර්මාන්තශාලීය ඉංජිනේරු	ශ්‍රී ලං.ඉ.සේ.	1	1	-	-	
නියෝජ්‍ය කර්මාන්තශාලීය ඉංජිනේරු	ශ්‍රී ලං.ඉ.සේ.	1	1	-	-	
කළමනාකරු - වැඩ	ශ්‍රී ලං.ඉ.සේ.	1	1	-	-	
කළමනාකරු - කාර්ය සම්පාදන	ශ්‍රී ලං.ඉ.සේ.	1	1	-	-	
කළමනාකරු - අළෙවි	ශ්‍රී ලං.ඉ.සේ.	1	1	-	-	
සහකාර/නියෝජ්‍ය කළමනාකරු - විදුලි/යාන්ත්‍රික	ශ්‍රී ලං.ඉ.සේ.	1	1	-	-	
සහකාර/නියෝජ්‍ය කළමනාකරු - සැලසුම්/ව්‍යාපෘති	ශ්‍රී ලං.ඉ.සේ.	1	1	-	-	
සහකාර/නියෝජ්‍ය කළමනාකරු - වඩු කාර්මික	ශ්‍රී ලං.ඉ.සේ.	1	1	-	-	
සහකාර/නියෝජ්‍ය කළමනාකරු - ශිල්පීය හා සුළුවැද්දුම්	ශ්‍රී ලං.ඉ.සේ.	1	0	-	1	
සහකාර/නියෝජ්‍ය කළමනාකරු - වාත්තු හා නඩත්තු	ශ්‍රී ලං.ඉ.සේ.	1	1	-	-	
සහකාර/නියෝජ්‍ය කළමනාකරු - වාහන	ශ්‍රී ලං.ඉ.සේ.	1	0	-	1	
සහකාර/නියෝජ්‍ය කළමනාකරු - විදුලි	ශ්‍රී ලං.ඉ.සේ.	1	0	-	1	
සහකාර/නියෝජ්‍ය කළමනාකරු - සැපයීම්	ශ්‍රී ලං.ඉ.සේ.	1	1	-	-	
සහකාර/නියෝජ්‍ය කළමනාකරු - පුහුණු	ශ්‍රී ලං.ඉ.සේ.	1	1	-	-	
සහකාර/නියෝජ්‍ය කළමනාකරු - සැලසුම් පර්යේෂණ/සංවර්ධන	ශ්‍රී ලං.ඉ.සේ.	1	0	-	1	
සහකාර/නියෝජ්‍ය කළමනාකරු - ව්‍යාපෘති	ශ්‍රී ලං.ඉ.සේ.	1	0	-	1	
සහකාර/නියෝජ්‍ය කළමනාකරු - පාලන	ශ්‍රී ලං.ප.සේ.	1	1	-	-	
ප්‍රධාන ගණකාධිකාරි	ශ්‍රී.ලං.ග.සේ.	1	1	-	-	
ගණකාධිකාරී - ගෙවීම්/ගබඩා	ශ්‍රී ලං.ග.සේ.	2	2	-	-	
ගණකාධිකාරී - අභ්‍යන්තර විගණන	ශ්‍රී ලං.ග.සේ.	1	-	-	1	
ජ්‍යෙෂ්ඨ මට්ටමේ එකතුව		**21**	**15**	**-**	**6**	

තනතුර	අදාල වන සේවය	අනුමත තනතුරු සංඛ්‍යාව	දැනට සේවයේ යෙදී ඇති සංඛ්‍යාව		පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්තය
		ස්ථිර	ස්ථිර	අනියම්/ කොන්ත්‍රාත්	-	
තෘතීක මට්ටම						
ජ්‍යෙෂ්ඨ යාන්ත්‍රික අධිකාරී	ශ්‍රී ලං.තා.සේ.	5	5	-	-	
ප්‍රධාන සැලසුම් ශිල්පි	ශ්‍රී ලං.තා.සේ.	1	-	-	1	
පරිපාලන නිලධාරී	රා.ක.ස.සේ. (අධි)	1	-	-	1	
තෘතීක මට්ටමේ එකතුව		**7**	**5**	**-**	**2**	
ද්විතික මට්ටම						
සංවර්ධන නිලධාරී	සං.නි.සේ	14	10	-	4	
අයවැය සහකාර	ආශ්‍රිත සේවා	1	1	-	-	
නීති සහකාර	උපාදිධාරී	1	1	-	-	
යාන්ත්‍රික අධිකාරී	ශ්‍රී ලං.තා.සේ.	18	15	-	3	
සැලසුම් ශිල්පි	ශ්‍රී ලං.තා.සේ.	4	4	-	-	
රාජ්‍ය කළමනාකරණ සහකාර	රා.ක.ස.සේ.	50	36	-	14	
පරිගණක රූ රටා නිර්මාණ ශිල්පි	ශ්‍රී ලං.තො.තා.සේ.	1	-	-	1	
වැඩහල් සහකාර	දෙපාර්තමේන්තුගත	17	18	-	-	1
වැඩහල් ලිපිකරු	දෙපාර්තමේන්තුගත	9	8	-	1	
කාලසටහන ලිපිකරු	දෙපාර්තමේන්තුගත	9	7	-	2	
සුභසාධක සහකාර	දෙපාර්තමේන්තුගත	1	-	-	1	
වැඩ පරිපාලක	දෙපාර්තමේන්තුගත	31	28	-	3	
ද්විතික මට්ටමේ එකතුව		**156**	**128**	**-**	**29**	**1**
ප්‍රාථමික මට්ටම						
රියදුරු	රියදුරු සේවා	15	13	-	2	
කාර්යාල කාර්යය සහායක	කාර්යාල සේවක සේ.	9	8	-	1	
ආරක්ෂක නිලධාරී	දෙපාර්තමේන්තුගත	1	1		-	
සනීපාරක්ෂක කම්කරු	දෙපාර්තමේන්තුගත	6	6	-	-	
කම්කරු ශිල්පීය (1-1 පන්තිය)	දෙපාර්තමේන්තුගත	206	155	-	51	
කම්කරු ශිල්පීය (1-11 පන්තිය)	දෙපාර්තමේන්තුගත	118	63	-	3	
කම්කරු අර්ධ ශිල්පීය (11 පන්තිය)			52			
කම්කරු ශිල්පීය නොවන	දෙපාර්තමේන්තුගත	80	44	-	**36**	
ප්‍රාථමික මට්ටමේ එකතුව		**435**	**342**	**-**	**93**	
මුළු එකතුව		**619**	**490**		**130**	**1**

3.0 2013 මූල්‍ය වර්ෂය සඳහා වන වැය විස්තරය

3.1 1 වන ව්‍යාපෘතිය - සාමාන්‍ය පාලනය හා කාර්ය මණ්ඩල සේවාවන්
2 වන ව්‍යාපෘතිය - නිපැයුම්, පිරිසැකසුම්, නඩත්තු හා අලුත්වැඩියා සේවාවන්

පුනරාවර්තන වියදම්	ව්‍යාපෘති 01(රු.මි.)	ව්‍යාපෘති 02 (රු.මි.)
පුද්ගල වැටුප්	20.985	24.923
වෙනත් වියදම්	8.627	-
උප එකතුව	**29.612**	**24.923**
මූලධන වියදම්	4.739	123.682
මුළු එකතුව	**34.351**	**148.615**

3.2 රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් B ගිණුම

විස්තරය	අස්තමේන්තුව අනුව (රු.මි.)	සත්‍ය අගය (රු.මි.)
උපරිම වියදම් සීමාව	**28.00**	**18.88**
අවම බැර සීමාව	**18.00**	**21.69**
උපරිම හර ශේෂ සීමාව	**122.00**	**86.06**

3.3 කළ වැඩ අත්තිකාරම් ගිණුම

2013 වසර සඳහා වන පිරිවැටුම රු.338,597,972 වන අතර ශුද්ධ ලාභය රු. 18,975,060.72 ක් වූ අතර මෙය පිරිවැටුමෙන් 5.6 % ක් පමණ විය.

3.4 ගබඩා අත්තිකාරම් ගිණුම

2013 වර්ෂය තුළ දී සැපයීම්හි වටිනාකම රු. 230,680,521.83 ක් වූ අතර මුරෙ 501(අ) ප්‍රකාරව ගබඩා අත්තිකාරම් පාඩු අපේක්ෂා නොකරනු ලබන්නාසේම ලාභ අපේක්ෂාවෙන් ද කටයුතු නොකරේ.

04. ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය

4.1) අවසන් කල හා වැඩ අවසන් නොකල ව්‍යාපෘති හා වැඩ- 2013 වර්ෂය
2013.01.01 - 2013.12.31 දිනට ප්‍රගතිය

	ව්‍යාපෘතිය	වාර්ෂික ඉලක්ක		ප්‍රගතිය *	
		භෞතික	මූල්‍ය (රු.මි.)	භෞතික %	මූල්‍ය (රු.මි.)
1	දැදුරු ඔය ව්‍යාපෘතිය සඳහා අරීය දොරටු 08 ක් සාදා සවිකිරීම	100%	150.00	70%	149.29
2	දැදුරුඔය ව්‍යාපෘතිය සඳහා පවර් ගේට්ටු 03 ක් සාදා සවිකිරීම	100%	25.00	55%	13.54
3	දැදුරුඔය ව්‍යාපෘතිය සඳහා මඩ ගේට්ටු 02 ක් සාදා සවිකිරීම.	100%	13.00	95%	9.22
4	අත්තික්කා අමුණ සඳහා අරීය දොරටු 08ක් සැලසුම්කර සාදා සවිකිරීම.	100%	20.00	40%	11.78
5	රාජ්‍ය උත්සව (නිදහස් උත්සවය හා වෙනත් උත්සව) සඳහා කොඩි කණු, විශේෂ පීඨිකාව සහ හිරු ආවරණ ඉදිකිරීම.	100%	20.00	100%	21.80
6	යක් අමුන ව්‍යාපෘතිය සඳහා දොරටු (power gates) 04 ක් සාදා සවිකිරීම.	100%	10.00	0%	0.00
7	නාච්චිදූව ව්‍යාපෘතිය සඳහා සොරොව් දොරටු 02 ක් සාදා සවිකිරීම, වාරිමාර්ග දෙපාර්තමේන්තුව.	100%	4.00	70%	3.46
8	අවුකන සහ මාලිගාවිල බුද්ධ ප්‍රතිමා සඳහා ආවරන වහල ඉදිකිරීම	100%	20.00	20%	5.88
9	ඩෙංගු මර්දන ව්‍යාපෘතියට අදාල දැඩිසත්කාර ඒකකවල ප්‍රතිකාර ගන්නා රෝගීන්ට අවශ්‍ය ඇඳන් 168ක් සාදා සැපයීම.	100%	18.00	12%	7.80
10	කැලිගම මිරිස්වත්ත ව්‍යාපෘතිය සඳහා වානේ ගේට්ටු 10 ක් සාදා සවිකිරීම, වාරිමාර්ග දෙපාර්තමේන්තුව.	100%	4.00	100%	9.55
11	මාවිල් අරු ව්‍යාපෘතිය සඳහා අරීය දොරටු 08 ක් අලුත්වැඩියා කර සවිකිරීම.	100%	2.00	100%	1.89
12	රඹකැන් ඔය ව්‍යාපෘතිය සඳහා අරීය දොරටු 02ක් සාදා සවි කිරීම.	100%	10.00	100%	14.05
13	නෙලු ඔය අමුණ සඳහා ෆ්ලැප් ගේට්ටු 03ක් සාදා සවි කිරීම.	100%	0.60	100%	0.53

	ව්‍යාපෘතිය	වාර්ෂික ඉලක්ක		ප්‍රගතිය *	
		භෞතික	මූල්‍ය (රු.මි.)	භෞතික %	මූල්‍ය (රු.මි.)
14	පොලිප්ටෝ ලංකා ආයතනයට, ප්ලාස්ටික් ප්‍රතිචක්‍රීකරණය යන්ත්‍රාගාරයක් ඉදිකිරීම	100%	7.46	100%	5.35
15	විදුලි ,යාන්ත්‍රික වැඩ හා යන්ත්‍රෝපකරණ අළුත්වැඩියාව හා නඩත්තු ඒකකය මගින් ඉටුකරන කාර්යයන්	100%	25.24	100%	40.52
16	බර පිරිසැකසුම් ඒකකය මගින් ඉටුකරන කාර්යයන්.	100%	45.40	100%	22.30
17	යාන්ත්‍රික දැව ඉරීම සහ දැව භාණ්ඩ සෑදීමේ ඒකකය මගින් ඉටුකරන කාර්යයන්.	100%	90.00	50%	45.61
18	සැහැල්ලු පිරිසැකසුම් ඒකකය මගින් ඉටුකරන කාර්යයන්.	100%	87.00	53%	46.22
19	වාත්තු වැඩ ඒකකය මගින් ඉටුකරන කාර්යයන්	100%	19.18	100%	23.46
20	සැහැල්ලු ඉංජිනේරු වැඩ ඒකකය මගින් ඉටුකරන කාර්යයන්.	100%	32.00	82%	26.30
21	වාහන අලුත්වැඩියා ඒකකය මගින් ඉටුකරන කාර්යයන්.	100%	17.87	81%	14.48
	මුළු එකතුව		**620.75**		**473.03**

4.2. විශේෂ සේවාවන්

ජාතික නිදහස් දින උළලේ ආචාර පියීකාව හා විශේෂ අමුත්තන් සඳහා වන කුටිය සුදානම් කිරීම, විදේශිය රාජ්‍ය නායකයින් හා විදේශීය නිලධාරින් පිළිගැනීම සඳහා කටුනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ විශේෂ පියීකාව හා පැමිණිමේ පර්යන්තය නිර්මාණය කිරීම සහ මැතිවරණ දෙපාර්තමේන්තුව සඳහා ඡන්ද පෙට්ටි සුදානම් කිරීම.

5.0 පුහුණුවීම 2013

5.1 පහත සඳහන් ආකාරයෙන් රජයේ කර්මාන්තශාලාව විසින් ආධුනිකයින් හා ඉංජිනේරුවරුන් සඳහා පුහුණුව ලබා දී ඇත.

පුහුණු විස්තරය		සංඛ්‍යාව	කාලය
1	ඉංජිනේරුවරුන් සඳහා.(ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය යටතේ)	01	මාස 06
2	ජාතික ඩිප්ලෝමා ආධුනිකයින්	35	මාස 06
3	පරිසනක හා අනෙකුත් සේවා වල ආධුනිකයින්	14	මාස 06

5.2 අභ්‍යන්තරික කාර්ය මණ්ඩලය වෙත ලබා දුන් විශේෂ පුහුණුවීම්

	සේවය	පුහුණු වැඩසටහන	ආයතනය	සංඛ්‍යාව	කාලය
1	කළමණාකාරණ සහකාර	ගබඩාකරණය පිළිබද පුහුණුව	රාජ්‍ය සේවා පුහුණු ආයතනය	1	දින 3
2	කළමණාකාරණ සහකාර	උසස් පරිගණක පුහුණුව	රාජ්‍ය සේවා පුහුණු ආයතනය	3	දින 5
3	කළමණාකාරණ සහකාර	විශ්‍රාම වැටුප් කටයුතු	රාජ්‍ය සේවා පුහුණු ආයතනය	1	දින 2
4	කළමණාකාරණ සහකාර	විනය කාර්ය පටිපාටිය	රාජ්‍ය සේවා පුහුණු ආයතනය	1	දින 3
5	කළමණාකාරණ සහකාර	මූලික පරිගණක පුහුණුව	රාජ්‍ය සේවා පුහුණු ආයතනය	2	දින 5
6	කළමණාකාරණ සහකාර	රාජ්‍ය කළමනාකරණ සහකාර වරුන් සඳහා සේවා ආරම්භක පුහුණුව	රාජ්‍ය සේවා පුහුණු ආයතනය	2	දින 10
7	කළමණාකාරණ සහකාර	කාර්යාල කළමනාකරණය	රාජ්‍ය සේවා පුහුණු ආයතනය	4	දින 5
8	කළමණාකාරණ සහකාර	මානව සම්පත් කළමණාකරණ පුහුණුව	රාජ්‍ය සේවා පුහුණු ආයතනය	1	දින5
9	කළමණාකාරණ සහකාර	*රාජ්‍ය ඉඩම් කටයුතු පිළිබද පුහුණුව*	රාජ්‍ය සේවා පුහුණු ආයතනය	1	දින3
10	කළමණාකාරණ සහකාර	ගබඩාකරණය පිළිබද උසස් සහතික පත්‍ර පාඨමාලාව	සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල (SDFL)	3	දින8
11	කළමණාකාරණ සහකාර	සපල ඉදිරිපත් කිරීමේ දක්ෂතා	සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල	1	දින2
12	කළමණාකාරණ සහකාර	වැටුප් පරිවර්ථනය හා කළමණා කරණය	PRAG Institute	4	දින1

13	කළමණාකාරණ සහකාර	ඉංග්‍රිසි පිළිබඳ ව සහතික පත්‍ර පාඨමාලාව	සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල	1	දින1
	සේවය	**පුහුණු වැඩසටහන**	**ආයතනය**	**සංඛ්‍යාව**	**කාලය**
14	කළමණාකාරණ සහකාර	මූලික ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටිය	-	2	දින 1
15	නීති සහකාර	ගණු දෙනු කිරීමේ දක්ෂතා	සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල	1	දින 1
16	නීති සහකාර	අභ්‍යාන්තර විගණනය	සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල	1	දින 1
17	කළමණාකාරණ සහකාර	කාර්යාල කළමනාකරණය	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය.	3	දින 5
18	ශ්‍රී.ලං.ඉ.සේ.	විශාල ගොඩනැගිලි සඳහා වායු සමීකරණ පද්ධති තෝරා ගැනීම, සවි කිරීම සහ ක්‍රියා කරවීම	ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන අධිකාරිය	1	දින 3
19	ශ්‍රී.ලං.ඉ.සේ.	විනය කාර්ය පටිපාටිය	ජාතික කම්කරු අධ්‍යාපන ආයතනය	2	දින 3
20	ශ්‍රී.ලං.ඉ.සේ.	විනය කාර්ය පටිපාටිය	සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල	1	දින 2
21	ශ්‍රී.ලං.ඉ.සේ.	දෙමුහුන් වාහන තාක්ෂණය	ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන අධිකාරිය	1	දින 1
22	ශ්‍රී.ලං.ඉ.සේ.	නායකත්වය සඳහා පුහුණු වැඩසටහන	ජාතික ඵලදායීතා ලෙකම්	1	දින 1
23	ශ්‍රී.ලං.ඉ.සේ.	වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව	සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල	1	දින 1
24	ශ්‍රී.ලං.ඉ.සේ.	විදුලි සවිකිරීම් සහ නඩත්තුව	ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන අධිකාරිය	2	7
25	ශ්‍රී.ලං.ඉ.සේ.	පරිපාලකයින් සඳහා ව්‍යාපාර රචනය	සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල	1	දින 2
26	ශ්‍රී.ලං.ඉ.සේ.	ජාල පද්ධති පරිපාලනය සඳහා අත්‍යවශ්‍ය දෑ	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	1	දින 6
26	ශ්‍රී.ලං.ඉ.සේ.	සැබෑ නායකත්වයක් සඳහා සුවිශේෂතා	සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල	1	දින 1
27	ශ්‍රී.ලං.ඉ.සේ.	අමුද්‍රව්‍ය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	මොරටුව විශ්ව විද්‍යාලය	1	අවු 3
28	ශ්‍රී.ලං.ඉ.සේ.	මිල ගණන් ඉදිරිපත් කිරීම සම්බන්ධ ප්‍රායෝගික වැඩමුළුව	සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල	1	දින 1
29	ශ්‍රී.ලං.ඉ.සේ.	අධික්ෂණ කළමනාකරණය	සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල	1	දින 1
30	ශ්‍රී.ලං.ඉ.සේ.	නන්ඩිස්ට්‍රක්ටිව් ටෙස්ටින්	පරමාණු ශක්ති අධිකාරිය	*1*	දින 17
31	ශ්‍රී.ලං.ඉ.සේ.	වෘත්තිකයින් සඳහා ඉංග්‍රිසි ඩිප්ලෝමාව	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	*1*	වසර 1

32	ගණකාධිකාරි සේවය	ආර්ථික විද්‍යා උපාධිය	කැළණිය විශ්ව විද්‍යාලය	1	වසර 3
33	සංවර්ධන නිලධාරි සේවය	වාණිජ විද්‍යා පශ්චාත් උපාධිය	කැළණිය විශ්ව විද්‍යාලය	1	වසර 3
	සේවය	**පුහුණු වැඩසටහන**	**ආයතනය**	**සංඛ්‍යාව**	**කාලය**
34	ශ්‍රී.ලං.ප.සේ.	වෘත්තිකයින් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමාව	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	1	වසර 1
35	ශ්‍රී.ල.තා.සේ.	වාණිජ ගොඩනැගිලි වල විදුලි සවිකිරීම් සහ නඩත්තුව	ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන අධිකාරිය	*2*	දින 3
36	ශ්‍රී.ල.තා.සේ.	ඵලදායීතා පටිපාටිය	ජාතික ශ්‍රම අධ්‍යාපන ආයතනය	3	දින 2
37	ශ්‍රී.ල.තා.සේ.	හොඳ නිමවුමක් සඳහා පුද්ගල අභිප්‍රේරණය	සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල	5	දින 1
38	ශ්‍රී.ල.තා.සේ.	නන්ඩිස්ට්‍රක්ටිව් ටෙස්ටින්	පරමාණු ශක්ති අධිකාරිය	1	දින 7
39	ශ්‍රී.ල.තා.සේ.	ගොඩනැගිලි වල සවි කර ඇති වායු සමීකරණ පද්ධති නඩත්තුව පිළිබඳ පාඨමාලාව	ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන අධිකාරිය	2	දින 3
40	ශ්‍රී.ල.තා.සේ.	රැකවරණ නිලධාරින් සම්බන්ධ සහතික පාඨමාලාව	ජාතික කම්කරු අධ්‍යාපන ආයතනය	1	දින 2
41	ශ්‍රී.ල.තා.සේ.	දෙමුහුන් වාහන තාක්ෂණය	ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන අධිකාරිය	1	දින 1
42	ශ්‍රී.ල.තා.සේ.	ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාව	ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන අධිකාරිය	2	දින 24
43	ශ්‍රී.ලං.ඉංජි.සේ.	වාණිජ ගොඩනැගිලි වල විදුලි සවිකිරීම සහ නඩත්තුව	ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන අධිකාරිය	01	දින 3

06. බාධාවන්

6.1 මූල්‍යමය බාධාවන්

නව තාක්ෂණය සහිත යන්ත්‍රෝපකරණ මිලදී ගැනීමට සහ වැඩහල් ගොඩනැගිලි නඩත්තුව සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් නිෂ්පාදන ඵලදායිතාවයට බලපෑමක් ඇති විය. මෙම තත්වය මඟහරවා ගැනීම සඳහා වාර්ෂික අයවැයෙන් ප්‍රමාණවත් ප්‍රතිසම්පාදන සපයාගත යුතුයි.

ඇස්තමේන්තු කරන ලද කාර්යයන් සඳහා අමුද්‍රව්‍ය වෙළඳපලෙහි ඇති වූ මිළ ඉහළ යාම් හේතුවෙන් අවාසිදායක තත්ත්වයක් නිර්මාණය විය. මෙම තත්ත්වය වාරිමාර්ග ව්‍යාපෘති සඳහා වන ජල කළමනාකරණ වානේ ගේට්ටු නිශ්පාදනයේ දී හා සවිකිරීමේ දී ද තරගකාරී ප්‍රසම්පාදන ක්‍රියාවළිය යටතේ ලබා ගන්නා වූ අනෙකුත් විශාල ව්‍යාපෘතීන් කෙරෙහිද අයහපත් ආකාරයෙන් බලපෑවේය.

6.2 පාලනමය බාධාවන්

කලමනාකරන සහකාර පුරප්පාඩු නොපිරවීමේ හේතුවෙන් දැඩි කළමනාකරණමය දුර්වලතා ඇතිවීමට හේතු වී තිබෙයි. මේ සම්බන්ධයෙන් වන ඉල්ලීම් කීපවරක්ම වගකිව යුතු ආයතනයන් වෙතින් ඉල්ලා සිටිය ද සඵලදායී පිළිතුරක් නොලද හෙයින් පෙර සඳහන් ඇබැර්තු තව දුරටත් පිරවිය යුතු තත්ත්වයේම පවතී.

නිපැයුම්, වැඩ හා සේවාවන් සම්බන්ධ ප්‍රසම්පාදන ක්‍රියා පරිපාටියේ පවත්නා ඍජු මාර්ගෝපදේශනය අනුගමනය කිරිමේදී යම් ප්‍රමාදයන් ඇති වනු ලැබීම හේතුවෙන් සේවාදායකයන් සමග ඇති කරගත් ගිවිසුම් ප්‍රකාරව ඇතැම් වැඩ නිමකොට භාර දිය නොහැකි වෙයි. මේ හේතුවෙන් රජයේ කර්මාන්තශාලාව සම්බන්ධයෙන් ඇතැම් සේවාදායකයින් තුළ පැවැති විශ්වාසය බිඳවැටිය හැකි අතර මෙම තත්ත්වය වර්තමාන වෙළඳපළේ පවතින තරගකාරී ස්වභාවයේ දී ආයතනයට අවාසිදායක ලෙස බලපෑ හැක.

7.0 වර්තමාන තත්වය 2016 ජුනි 15

1. 2015 වර්ෂයේ බලාපොරොත්තු වු පිරිවැටුම් ඉලක්කය රුපියල් මිලියන 610.00ක් වුවද, කළ වැඩ අත්තිකාරම් ගිණුමේ පිරිවැටුම රු.මි. 383 ක් වන අතර වියදම රු.මි. 378.8 ක් විය. ඒ අනුව අතිරික්තය රු.මි 4.28 විය. පාලනය කල නොහැකි පහත සඳහන් ගැටළු හේතුවෙන් වර්ෂයේ පිරිවැටුම් අඩු වී ඇත.

   (අ) ගණුදෙනුකරුවන්ගේ ඉලක්ක සැපයීමේදී ප්‍රසම්පාදන රෙගුලාසි වලට අනුව භාණ්ඩ හා අමුද්‍රව්‍ය සපයා ගැනීමට කාලයක් ගතවන බැවින් 2015 වර්ෂයේ සම්පූර්ණ කරන ලද සහ කරගෙන යමින් පැවති ව්‍යාපෘති සඳහා අමුද්‍රව්‍ය සපයන ලද්දේ ගණුදෙනුකරු විසිනි. එබැවින් එම වටිනාකම අඩුවන බැවින් අපේක්ෂිත පිරිවැටුම අඩුවී ඇත.

   (ආ) වාත්තු හා දැව භාණ්ඩ නිෂ්පාදනය කරන ලද වැඩහල් සඳහා ප්‍රමාණවත් වැඩ ප්‍රමාණයක් ලබා ගැනීමට උත්සහ කලද තරගකාරිත්වය නිසා අපගේ මිල ගණන් වලට වඩා අඩු මිල ගණන් වෙනත් අයතන හා පුද්ගලයින් ඉදිරිපත් කිරීමෙන් අප ආයතනයට ඇණවුම් ලැබීම අඩු වු බැවින් පිරිවැටුම අඩු වීමට හේතු විය.

   (ඇ) උමා ඔය ව්‍යාපෘතිය යටතේ අලිකොට ආරු වාරිමාර්ග ජල පාලන දොරටු සාදා සවිකිරීම සහ ගපූර් ගොඩනැගිල්ලේ දැව අලුත්වැඩියා කටයුතු පිරිවැටුම ඉලක්ක කර තිබුනද එම ව්‍යාපෘති කරගෙන යාම පිලිබඳ පැහැදිලි උපදෙස් නොලැබීම හා එම වැඩ කටයුතු කරගෙන යාම ප්‍රමාද විම නිසා ඉලක්ක වලට යාම අපහසු විය.

2. කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම. පුරප්පාඩු ප්‍රමාණය පහත සඳහන් කර ඇත.

ඉංජිනේරුවරු	-	02
ගණකාධිකාරීවරු	-	01
පරිපාලන නිලධාරීන්	-	01
කළමණාකරණ සහකාර	-	11
සංවර්ධන සහකාර	-	05
පුහුණු කම්කරු	-	74
නුපුහුණු කම්කරු	-	15
එකතුව		108

මේ වන විටපුහුණු කම්කරු බඳවාගැනීමේ පරිපාටි සම්බන්ධව අවසන් තීරණ ගැනීමට නියමිතය.

3. 2015-12.31 දිනට රාජ්‍ය ආයතන වලින් 2013 හා 2014 වර්ෂයේ ලැබිය යුතු මුදල් නොලැබීම හා ප්‍රමාද වීම.

2013	-	රු. 23,035,442.11
2014	-	රු. 58,185,491.68

4. මෙම තත්වය වලක්වා ගැනීම හා ආයතනය ඵලදායි තත්වයට පත් කර ගැනීම සඳහා ආයතනය ප්‍රතිව්‍යුහගත කිරීමට අදාල කටයුතු අවසන් කරමින් පවතින අතර කලමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ නිර්දේශ අනුව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර ඇත.

5. ආයතනික මට්ටමෙන් යහපත් මුල්‍ය පාලනය තුලින් වියදම් අඩුකර ගැනීමට කටයුතු කර ඇත.